# ආර්ථික සේවා ගාස්තුව (ECONOMIC SERVICE CHARGE (ESC)

මෙම නිබන්ධනය 2017/2018 තක්සේරු වර්ෂය සඳහා අදාළ වන නීතිය පැහැදිලි කරයි.

**බදු බැඳියාව**

වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කර ගෙන යන සෑම තැනැත්තෙක්ම හා හවුල් ව්‍යාපාරයක්ම එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය ආදායම් බදු ගෙවීමට යටත් වූව ද නොවුව ද, ආර්ථික සේවා ගාස්තුව ගෙවිය යුතුය.

නමුත්, සමුපකාර සමිති, ගුවන් සහ නාවුක සමාගම්, පළාත් පාලන ආයතන, රජයේ දෙපාර්තමේන්තු, යම් බෙදාහරින්නෙක්, යම් ලොතරැයි වෙළෙන්දෙක්, ඒකක භාරයක්, අන්‍යොන්‍ය අරමුදලක් සහ ලක් සතොස ආර්ථික සේවා ගාස්තුවට යටත් නොවේ.

**බදු පදනම සහ බද්දට යටත් සීමාව**

2017 අප්‍රේල් 01 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් කාර්තුවක බද්දට යටත් පිරිවැටුම රු. මිලියන 12.5 ඉක්මවන්නේ නම්, සෑම තැනැත්තෙක්ම හා හවුල් ව්‍යාපාරයක්ම ආර්ථික සේවා ගාස්තුව ගෙවිය යුතුය.

**ආර්ථික සේවා ගාස්තු අනුපාතය**

අදාළ වන අනුපාතය වන්නේ අදාළ පිරිවැටුම මත 0.5% කි. (2016 අප්‍රේල් 01 වන දින සිට)

**බද්දට යටත් පිරිවැටුම**

සත්‍ය වශයෙන්ම ලැබුන ද නොලැබුන ද සෑම ගනුදෙනුවකින්ම ලැබිය යුතු වන මුදල් ප්‍රමාණය යි.
නමුත් පහත ඒවා බද්දට යටත් පිරිවැටුමට ඇතුළත් නොවේ.

- එකතු කළ අගය මත බද්ද
- ප්‍රාග්ධන වත්කම් බැහැර කිරීමෙන් ලත් මුදල්
- බොල් ණය

**පිරවුම්හල්වල ආර්ථික සේවා ගාස්තු බැඳියාව**

2017.04.01 දින සිට ආරම්භ වන යම් කාර්තුවක් සඳහා වන මුළු පිරිවැටුම රු. මිලියන 12.5 ඉක්මවන්නේ නම්, පිරවුම්හලකින් පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් අලෙවියෙන් ලැබෙන පිරිවැටුම ආර්ථික සේවා ගාස්තුවට යටත් වේ.

නමුත්, පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්වල අදාළ පිරිවැටුමෙන් 1/10 ක් මත සහ වෙනත් නිශ්පාදන (ලිහිසි ද්‍රව්‍ය වැනි) අලෙවිය හා සේවා ගාස්තු ඇත්නම්, ඒවායේ මුළු පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තුව ගණනය කළ යුතුය.

## බද්ද ගෙවීම

කාර්තු හතරකින් ස්ව තක්සේරු මත ආර්ථික සේවා ගාස්තුව ගෙවිය යුතුය.

| කාර්තුව | ගෙවීම් දිනය |
|---|---|
| පළමු කාර්තුව | ජූලි මස 20 වන දින හෝ ඊට පෙර |
| දෙවන කාර්තුව | ඔක්තෝබර් මස 20 වන දින හෝ ඊට පෙර |
| තුන්වන කාර්තුව | ජනවාරි මස 20 වන දින හෝ ඊට පෙර |
| හතරවන කාර්තුව | අප්‍රේල් මස 20 වන දින හෝ ඊට පෙර |

## අත්තිකාරම් ආර්ථික සේවා ගාස්තු සහ ආර්ථික සේවා ගාස්තුව හිලව් කිරීම

පහත භාණ්ඩ ආනයනයේදී, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් සහතික කරන ලද CIF අගය මත (පිරිවැටුම් සීමාව නොසලකා) රේගුව විසින් ආර්ථික සේවා ගාස්තු අය කරනු ලැබේ.

- විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට  යටත්  වන  ඕනෑම භාණ්ඩයක් මත
- රත්‍රන් සහ වටිනා ලෝහ මත
- මෝටර් වාහන මත

රේගුව වෙත කලින් ගෙවූ  ආර්ථික සේවා ගාස්තු, අදාළ භාණ්ඩ නිෂ්කාෂණය කළ දිනය ඇතුලත් වන කාර්තුවේ ආර්ථික සේවා ගාස්තු වගකීමට බැර කළ හැක. නමුත්, ඉතිරි ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුවක් වේ නම්, එය කාර්තුව අවසන් වීමෙන් පසු එළඹෙන මාසයේ 20 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

කලින් ගෙවූ  ආර්ථික සේවා ගාස්තු සහ 2016 අප්‍රේල් 01 වන දින හෝ ඉන් පසු කාල පරිච්ඡේදයක් සඳහා කරන ලද ස්ව තක්සේරු ගෙවීම් අදාළ තක්සේරු වර්ෂයේ ආදායම් බද්දට හිලව් කළ හැකි අතර යම් ශේෂයක් ඇත්නම්, අනතුරුව එළඹෙන තක්සේරු වර්ෂ දෙකක ආදායම් බද්දට හිලව් කිරීම සඳහා ඉදිරියට ගෙන යා හැක.

කෙසේ වුවද, 2016.03.31 දින දක්වා වූ කාල පරිච්ඡේදයක් සඳහා ගෙවන ලද  අතිරික්ත ආර්ථික සේවා ගාස්තුවක් ඇත්නම්, ඉදිරි තක්සේරු වර්ෂ හතරක ආදායම් බද්දට හිලව් කිරීම සඳහා ඉදිරියට ගෙන යා හැක.

## වාර්තා ඉදිරිපත් කිරීම

ආර්ථික සේවා ගාස්තු වාර්තාව, එම තක්සේරු වර්ෂය අවසානයෙන් පසු එළඹෙන මාසයේ 20 වන දින හෝ ඊට පෙර වාර්ෂික ව ඉදිරිපත් කළ යුතු ය. (එනම්, 2017/18 තක්සේරු වර්ෂය සඳහා 2018 අප්‍රේල් 20)

**නිදසුන් 01**

සී/ස සසිරි (පුද්ගලික) සමාගම දේශීය වෙළඳපල සඳහා රෙදි පිළි නිෂ්පාදනය කිරීමේ නිරතව සිටියි. 2017/18 තක්සේරු වර්ෂයේ එක් එක් කාර්තුවේ පිරිවැටුම පහත දැක්වේ.

| කාර්තුව | පිරිවැටුම රු |
|---|---:|
| 2017 ජුනි 30න් අවසන් වූ කාර්තුව | 29,600,000 |
| 2017 සැප්තැම්බර් 30න් අවසන් වූ | 10,500,000 |
| 2017 දෙසැම්බර් 31න් අවසන් වූ කාර්තුව | 34,500,000 |
| 2018 මාර්තු 31න් අවසන් වූ කාර්තුව | 82,000,000 |
| | **156,600,000** |

2017/18 තක්සේරු වර්ෂයේ එක් එක් කාර්තුව සඳහා ආර්ථික සේවා ගාස්තු වගකීම තක්සේරු කරන්න.

**<u>පිළිතුර</u>**

| කාර්තුව | පිරිවැටුම | ආර්ථික සේවා ගාස්තු |
|---|---:|---:|
| 2017 ජුනි 30න් අවසන් වූ | 29,600,000 | 148,000 |
| 2017 සැප්තැම්බර් 30න් | 10,500,000 | බද්දට යටත් නොවේ. |
| 2017 දෙසැම්බර් 31න් අවසන් | 34,500,000 | 172,500 |
| 2018 මාර්තු 31න් අවසන් වූ | 82,000,000 | 410,000 |
| | **156,600,000** | **730,500** |

**නිදසුන් 02**

සී/ස දෙව්රස (පුද්ගලික) සමාගම, ප්‍රසිද්ධ ආහාර සැකසුම් සමාගමකි. 2018 මාර්තු 31න් අවසන් වූ කාර්තුව සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු. |
|---|---:|
| සමාගම නිපද වූ ආහාර විකිණීමෙන් | 64,500,000 |
| ආනයනය කළ ආහාර විකිණීමෙන් | 12,560,000 |
| කාර්යාල උපකරණ විකිණීමෙන් | 1,250,000 |
| පොලී ආදායම | 400,000 |

2018 මාර්තු 31න් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව තක්සේරු කරන්න.

**<u>පිළිතුර</u>**

| | රු. |
|---|---:|
| සමාගම නිපද වූ ආහාර විකිණීමෙන් | 64,500,000 |
| ආනයනය කළ ආහාර විකිණීමෙන් | 12,560,000 |
| කාර්යාල උපකරණ විකිණීමෙන් - බද්දට යටත් නොවේ. | - |
| පොලී ආදායම - බද්දට යටත් නොවේ. | - |
| | 77,060,000 |
| ආර්ථික සේවා ගාස්තුව 0.5% බැගින් | **<u>385,300</u>** |